# පිරිවැයකරණ ක්‍රම


# පිරිවැයකරණ ක්‍රම
Costing Methods

පිරිවැයකරණ ක්‍රමයක් යනුවෙන් අදහස් කරනුයේ නිපදවන භාණ්ඩවලට හෝ සපයන සේවාවලට ගැලපෙන ආකාරයෙන් නිර්මාණය කළ පිරිවැය සෙවීමේ ක්‍රමයකි.

විවිධ වූ කර්මාන්තවල නියැලී සිටින නැතහොත් විවිධ වූ නිෂ්පාදන ක්‍රම භාවිතා කරන ආයතනවල වෙනස් වූ පිරිවැයකරණ ක්‍රම දක්නට ඇත. මෙහිදී තේරුම්ගත යුතු සහ සටහන් කරගත යුතු විශේෂ කරුණක් වන්නේ, භාවිතා කරන පිරිවැයකරණ ක්‍රමය කුමක් වූවත්, පිරිවැයකරණයේ මූලික සංකල්පවල වෙනසක් ඇති නොවේ.

සියළුම පිරිවැයකරණ ක්‍රම කොටස් 2 ක් යටතේ වර්ග කල හැක. ඒවා නම්,

- විශේෂිත ඇනවුම් පිරිවැයකරණ ක්‍රම
- අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණ ක්‍රම (ඒකීය පිරිවැයකරණය)




පිරිවැයකරණය ක්‍රම

එකිනෙකට වෙන්කොට හඳුනාගත හැකි පිරිවැය ඒකකයන් නිපදවන නිෂ්පාදන ආයතනවලට වඩාත් සුදුසුවන ක්‍රම ලෙස විශේෂිත ඇනවුම් පිරිවැයකරණ ක්‍රම හැඳින්විය හැක. මේ යටතේ පහත ක්‍රම පිළිබඳව සාකච්ඡා කෙරේ.

- කාර්යය පිරිවැයකරණය
- කාණ්ඩ පිරිවැයකරණය
- කොන්ත්‍රාත්තු පිරිවැයකරණය

## කාර්යය පිරිවැයකරණය (Job Costing)

ගනුදෙණුකරුවෙකුගේ අවශ්‍යතාවයකට අනුව නැතහොත් උපදෙස් පරිදි ඉටුකර දීමට බාර ගන්නා කටයුත්තක්, කාර්යයක් ලෙස හැඳින් වේ. **උදාහරණයක් ලෙස, ගනුදෙණුකරුවෙකුගේ අවශ්‍යතාවයකට අනුව කොටස් එකලස් කර පරිගණකයක් සාදා දීම.** එවැනි කාර්යයක පිරිවැය සෙවීමේ ක්‍රමය, ''කාර්යය පිරිවැයකරණය'' ලෙස හැඳින් වේ. කාර්යය පිරිවැයකරණයේ ප්‍රධාන අරමුණ වන්නේ කාර්යයේ පිරිවැය සෙවීමත් එමගින් ඒ මත වූ ලාභය හෝ අලාභය තීරණය කිරීමත් ය.

### අභ්‍යාස

පහත දී ඇති තොරතුරු, ඉංජිනේරු වැඩක් වන කාර්යය අංක 232 ට අදාල පිරිවැය වාර්තාවලින් උපුටාගෙන ඇත.

| | | | | |
|---|---|---|---|---|
| කාර්යය සඳහා නිකුත් කල ද්‍රව්‍ය | | | රු. 16,040 | |
| සෘජු වැටුප් : | දෙපාර්තමේන්තු A | - | පැයකට රු. 6 බැගින් පැය | 120 |
| | දෙපාර්තමේන්තු B | - | පැයකට රු. 4 බැගින් පැය | 80 |
| | දෙපාර්තමේන්තු C | - | පැයකට රු. 10 බැගින් පැය | 40 |

නිෂ්පාදන පොදුකාර්ය වියදම් පහත පරිදි විය.

| | | | |
|---|---|---|---|
| විචල්‍ය : | දෙපාර්තමේන්තු A | - | පැය 500 ක් සඳහා රු. 10,000 |
| | දෙපාර්තමේන්තු B | - | පැය 150 ක් සඳහා රු. 6,000 |
| | දෙපාර්තමේන්තු C | - | පැය 50 ක් සඳහා රු. 4,000 |
| ස්ථාවර : | පැය 1,000 ක් සඳහා රු. 40,000 | | |

කාර්යය අංක 232 ට අදාල පිරිවැය හා විකුණුම් මිලෙන් 25% ලාභයක් සඳහා වූ විකුණුම් මිල ගණනය කරන්න.

## කාණ්ඩ පිරිවැයකරණය (Batch Costing)

විශේෂිත ඇනවුම් පිරිවැයකරණය යටතට ගැනෙන තවත් පිරිවැයකරණ ක්‍රමයක් ලෙස මෙය හැඳින්විය හැක. එක සමාන ලක්ෂණ ඇති අයිතම් රාශියක එකතුවක්, කාණ්ඩයක් ලෙස නිර්වචනය කළ හැක. කාණ්ඩයක්, කාර්යයකට බොහෝ සෙයින් සමාන වන අතර පිරිවැය ඒකකය වන්නේ සමස්ත කාණ්ඩයයි. කාණ්ඩය තුළ ඇති එක් අයිතමයක පිරිවැය සෙවීමට නම්, කාණ්ඩයේ මුළු පිරිවැය, අයිතම් ගණනින් බෙදිය යුතුය.

## අභ්‍යාස

සමාගමක් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව සපත්තු නිෂ්පාදනයේ යෙදී සිටින අතර පහත සඳහන් අයවැයගත පොදුකාර්ය දත්ත වර්ෂය සඳහා අදාළ වේ.

| දෙපාර්තමේන්තුව | අයවැයගත නි.පො.කො | අයවැයගත ක්‍රියාකාරකම් |
|---|---|---|
| කැපීම් | රු. 120,000 | යන්ත්‍ර පැය 6,000 |
| සවිකිරීම් | රු. 200,000 | ශ්‍රම පැය 5,000 |
| නිමකිරීම් | රු. 150,000 | ශ්‍රම පැය 15,000 |

නිෂ්පාදන පිරිවැයට 20% ක් වූ අනුපාතයක් මත, විකුණුම් හා පරිපාලන පොදුකාර්ය අන්තර්ග්‍රහණය කළ යුතුය. ස්වරූපයෙන් සමාන සපත්තු කුට්ටම් 200 ක් සැපයීමට, පාසැලකින් සමාගමට ඇනවුමක් ලැබී ඇත.

මෙම කාණ්ඩය සඳහා ලබා දී ඇති අනුක්‍රමික කාණ්ඩ අංකය 2002 වේ. පහත දී ඇති පිරිවැය මෙම කාණ්ඩ 2002 වෙනුවෙන් සමාගම දරා ඇත.

අමුද්‍රව්‍ය රු. 80,000

කාණ්ඩය වෙනුවෙන් ගත කළ සත්‍ය කාලය :

| | | |
|---|---|---|
| කැපීම් දෙපාර්තමේන්තුව | - | යන්ත්‍ර පැය 2,000 |
| සවිකිරීම් දෙපාර්තමේන්තුව | - | ශ්‍රම පැය 750 |
| නිමකිරීම් දෙපාර්තමේන්තුව | - | ශ්‍රම පැය 1,000 |

රු. 42,000 ක පිරිවැයක් දරා, මෙම ඇනවුම සඳහා විශේෂ වූ සවිකිරීම් යන්ත්‍රයක් කුලියට ලබාගෙන ඇත.

ඍජු ශ්‍රම වැටුප් අනුපාතයන් :

| | | |
|---|---|---|
| සවිකිරීම් දෙපාර්තමේන්තුව | - | පැයකට රු. 40 |
| නිමකිරීම් දෙපාර්තමේන්තුව | - | පැයකට රු. 20 |

සෑම ඇනවුමකම විකුණුම් මිල මත 20% ක ලාභාන්තිකයක් තබාගැනීම, සමාගමේ මිල කිරීමේ ප්‍රතිපත්තිය වේ.

එක් සපත්තු කුට්ටමක පිරිවැය හා විකුණුම් මිල ගණනය කරන්න.

## සේවා පිරිවැයකරණය (Service Costing)

සේවා පිරිවැයකරණය හෙවත් මෙහෙයුම් පිරිවැයකරණය යනු අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණයට අයත් තවත් පිරිවැයකරණ ක්‍රමයකි.

මෙහිදී අප අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන්නේ, සේවා ආයතන විසින් භාවිතා කරන පිරිවැයකරණ ක්‍රම පිළිබඳවයි. ඒවා සේවා පිරිවැයකරණය නම් වේ.

මෙලෙස සපයන සේවාවන්, මහජන ප්‍රවාහනය, හෝටල් කර්මාන්තය, සෞඛ්‍ය සේවාව, විදුලි බලය ජනනය, භෝජනාගාර වැනි බාහිර සේවාවන් මෙන්ම, ආපනශාලා, නඩත්තු, ගබඩාව, මිලට ගැනීම් අංශය වැනි අභ්‍යන්තර සේවාවන් ද විය හැක.

මෙහි දී මුහුණදෙන දුෂ්කර කාර්යයක් වන්නේ පිරිවැය ගණනය කිරීම සඳහා වූ පිරිවැය ඒකකයක් තීරණය කිරීම පිළිබඳවයි. ''**සංයුක්ත පිරිවැය ඒකකය**'' යන සංකල්පය වඩාත් අදාළ මෙන්ම තාර්කික වේ.

## සංයුක්ත පිරිවැය ඒකකය (Composite Cost Unit)

දැනටමත් පැහැදිලි කර ඇති පරිදි, යම් පිරිවැය ඒකකයක් කොටස් දෙකක් හෝ වැඩි ගණනකින් සමන්විත වේ නම් ''සංයුක්ත පිරිවැය ඒකකය'' සංකල්පය අදාළ වේ. එනම් පිරිවැය ඒකකයක්, උප ඒකක දෙකක් හෝ කිහිපයක එකතුවකි.

**උදාහරණ :**

| සේවා කර්මාන්ත | භාවිත කළ හැකි සංයුක්ත පිරිවැය ඒකකය |
|---|---|
| මගී ප්‍රවාහනය | එක් මගියෙකුට - කිලෝමීටරයක් |
| භාණ්ඩ ප්‍රවාහනය | ටොන් එකක් - කිලෝමීටරයක් |
| රෝහල් | එක් ලෙඩෙක් - දිනක් |
| විදුලි බල සැපයුම් | කිලෝවොට් පැය (KWH) |
| ආපනශාලා | එක් පුද්ගලයෙකුට - එක වේලක් |
| සිනමා ශාලාවක් | එක් පුද්ගලයෙකුට - එක දර්ශන වාරයක් |
| ගෑස් | නිපදවන ඝන අඩි 1,000 ක් |
| නවාතැන්පලක් | එක් පුද්ගලයෙකුට - එක දිනක් |

සේවා පිරිවැයකරණයේ ප්‍රධානම ලක්ෂණයක් වන්නේ, බොහෝ පිරිවැය ඒවායේ ස්වභාවයෙන්ම ස්ථාවර වේ. නිදසුනක් ලෙස, සිනමා ශාලාවක මෙහෙයුම් පිරිවැය, ප්‍රේක්ෂකයන්ගේ ගණන මත තීරණය නොවේ.

සේවා අංශයේ නියැලෙන සෑම ආයතනයක්ම පිරිවැයකරණයේ දී ප්‍රවේශමෙන් තීරණය කළ යුතු දෙයක් වන්නේ, තම පරමාර්ථයන් සඳහා වඩාත් යෝග්‍ය වන පිරිවැය ඒකකය කුමක් ද යන්නයි. කුමන ආකාරයක පිරිවැය ඒකකයක් හඳුන්වා දුන්නද, ඒකකයක පිරිවැය පහත පරිදි ගණනය කෙරේ.

$$\textbf{ඒකකයක පිරිවැය} = \frac{\textbf{කාලපරිච්ඡේදයේ මුළු පිරිවැය}}{\textbf{කාලපරිච්ඡේදය තුළ සැපයූ මුළු සේවා ඒකක}}$$

''කලම්බු රයිඩර් ට්‍රාන්ස්පෝර්ට්'' (CRT) යනු මගී ප්‍රවාහනය සඳහා බස්රථ සමුහයක් යොදවා ඇති, සුළු පරිමාණ ප්‍රවාහන සමාගමකි. ඔවුන්ගේ පොත් වලින් උපුටාගත් පහත තොරතුරු වලින්, ධාවනය කළ කිලෝමීටර් ගණන හා මගී කිලෝමීටර් ගණන සොයන්න.

| | | |
|---|---|---|
| බස්රථ ගණන | : | 4 |
| මාසයකට වැඩකරන දින ගණන | : | 30 |
| බස්රථයක් ධාවනය වන වාර ගණන | : | 4 (දිනකට) |
| මාර්ගයේ දුර | : | කිලෝමීටර 30 (එක් දිශාවකට) |
| බස්රථයක ධාරිතාව | : | මගීන් 60 |
| ගමන් කරන මගීන්ගේ සාමාන්‍යය | : | ධාරිතාවයෙන් 80% |

## අභ්‍යාස

ලොරි සමූහයක් පවත්වා ගනිමින් ප්‍රවාහන සේවා සපයන සමාගමකට අදාළ 2020 අප්‍රේල් මාසය සඳහා වූ තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| මාසය තුළ ධාවනය කළ කි.මීටර ගණන | 30,000 |
| මාසය සඳහා වැටුප් (රු.) | 60,000 |
| ගරාජ කුලී (රු.) | 30,000 |
| ඩීසල් හා තෙල්.... වැනි වියදම් (රු.) | 120,000 |
| ඉඩදිය හැකි වාර්ෂික ක්ෂය (පිරිවැය මත) | 25% |
| ලොරිවල මූලික පිරිවැය (රු.) | 6,000,000 |
| මාසය සඳහා අලුත්වැඩියා වියදම් (රු.) | 360,000 |
| වාර්ෂික බලපත්‍ර, රක්ෂණ ගාස්තු (රු.) | 360,000 |

එක් ධාවන කිලෝමීටරයක් සඳහා විචල්‍ය හා ස්ථාවර ගාස්තුව පෙන්වමින්, 2020 අප්‍රේල් මාසය සඳහා ප්‍රකාශනයක් සකස් කරන්න.

**2020 අප්‍රේල් සඳහා මෙහෙයුම් පිරිවැය ප්‍රකාශය**

| ධාවනය කළ කිලෝමීටර් ගණන : 30,000 | | |
|---|---|---|
| | රු. | කි. මී. ට (රු.) |
| **ස්ථාවර වියදම් :** | | |
| වැටුප් | 60,000 | |
| ගරාජ කුලී | 30,000 | |
| බලපත්‍ර, රක්ෂණ වැනි (360,000/12) | 30,000 | |
| ක්ෂය | 125,000 | |
| | 245,000 | 8.17 |
| **විචල්‍ය පිරිවැය :** | | |
| ඩීසල්, තෙල් වැනි | 120,000 | |
| අලුත්වැඩියා | 360,000 | |
| | 480,000 | 16 |
| **මුළු පිරිවැය** | 725,000 | 24.17 |

## අභ්‍යාසය 01

**රියානා** හට ඇගේ උපන්දින සාදය **Party 4You** නම් උත්සව කළමනාකරණ සමාගමක් (event management company) මගින් සංවිධානය කර ගැනීමට අවශ්‍යව ඇති අතර, ඔවුන් විසින් එම සාදයට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

| | |
|---|---|
| ආහාර ද්‍රව්‍ය සඳහා පිරිවැය | අවම වශයෙන් පුද්ගලයන් 25 දෙනෙකුට යටත්ව පුද්ගලයෙකුට රු.300/- බැගින්. |
| සංගීත කණ්ඩායම, සංගීත භාණ්ඩ සහ සැරසිලි සඳහා පිරිවැය | සාදයක් සඳහා රු.8,500/- බැගින්. |
| ඡායාරූපකරණය | සාදයක් සඳහා රු.10,000/- බැගින්. |
| ශාලා ගාස්තු | සාදයක් සඳහා රු.15,000/- බැගින්. |
| සේවා කාර්ය මණ්ඩලය සැපයීම වෙනුවෙන් වෙන් කිරීම | සේවකයෙකු සඳහා රු.2,500/- බැගින්. |
| වෙනත් පොදුකාර්ය වියදම් වෙන් කිරීම | සාදයක් සඳහා රු.3,950/- බැගින්. |

පුද්ගලයන් 32 ක් සාදය සඳහා සහභාගි වනු ඇතැයි **රියානා** අපේක්ෂා කරනු ලබන අතර, සේවා කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගේ (2) සේවය මේ සඳහා ලබාගැනීමට බලාපොරොත්තු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**රියානා** විසින් ඇගේ උපන්දින සාදය සඳහා ගෙවීමට සිදුවන මුළු පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 05)

## අභ්‍යාසය 02

**සීමාසහිත රෝස් සමාගමේ, කාර්යය අංක 2500** ට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

සෘජු අමුද්‍රව්‍ය : කිලෝග්‍රෑම් එකක් රු.25/- බැගින් කිලෝග්‍රෑම් 5,000

සෘජු ශ්‍රමය : පැයකට රු.500/- බැගින් පැය 200

නිෂ්පාදන පොදුකාර්ය : සෘජු ශ්‍රම පිරිවැයෙන් 150%

සමාගම, පිරිවැය මත 20% ක ලාභයක් තබා ගනී.

**කාර්යය අංක 2500** මත අයකළ යුතු මිල ගණනය කරන්න. (ලකුණු 04)

## අභ්‍යාසය 03

**සීමාසහිත බිත් සමාගමේ, කාර්යය අංක 2232** ට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| කාර්යය සඳහා නිකුත්කළ අමුද්‍රව්‍ය | කිලෝග්‍රෑම් 200 ක්, කිලෝග්‍රෑම් 01 ක් රු.15,500/- බැගින් |
| සෘජු ශ්‍රමය - **X** දෙපාර්තමේන්තුව | පැය 250 ක්, පැයකට රු.800/- බැගින් |
| - **Y** දෙපාර්තමේන්තුව | පැය 750 ක්, පැයකට රු.800/- බැගින් |
| නිෂ්පාදන පොදුකාර්ය - **X** දෙපාර්තමේන්තුව | **X** දෙපාර්තමේන්තුවේ සෘජු ශ්‍රම පිරිවැයෙන් 75% ක් |
| - **Y** දෙපාර්තමේන්තුව | **Y** දෙපාර්තමේන්තුවේ සෘජු ශ්‍රම පිරිවැයෙන් 150% ක් |

සමාගම, විකුණුම් මිල මත 20% ක ලාභයක් පවත්වා ගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**කාර්යය අංක. 2232** මත අය කළ යුතු මිල **ගණනය කරන්න.** (ලකුණු 05)

## අභ්‍යාසය 04

**සීමාසහිත හාඩ් ටියුබ්ස් සමාගම,** ටයර් නිෂ්පාදනය කරන සමාගමක් වන අතර, ඔවුන්ට විශේෂිත වූ ටයර් 240 ක් නිපදවීම සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් විශේෂ ඇණවුමක් ලැබී තිබේ. **A** සහ **B** නමැති දෙපාර්තමේන්තු දෙකක් හරහා නිෂ්පාදනය සිදුකරනු ලබයි. මෙම ඇණවුමට ලබා දී ඇති කාණ්ඩ අංකය **102** වේ.

පහත සඳහන් තොරතුරු කාණ්ඩ අංක **102** ට අදාල වේ:

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | - වානේ | කිලෝග්‍රෑම් 1,705 (කිලෝග්‍රෑමයක් රු.150/- බැගින්) |
| | - රබර් | කිලෝග්‍රෑම් 2,850 (කිලෝග්‍රෑමයක් රු.400/- බැගින්) |
| සෘජු ශ්‍රමය | - **A** දෙපාර්තමේන්තුව | පැය 1,250 (පැයකට රු.225/- බැගින්) |
| | - **B** දෙපාර්තමේන්තුව | පැය 1,725 (පැයකට රු.190/- බැගින්) |

| **දෙපාර්තමේන්තු** | **A** | **B** |
|---|---|---|
| සෘජු ශ්‍රම පැයකට නිෂ්පාදන පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය | රු.120/- | රු.90/- |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) කාණ්ඩයේ මුළු පිරිවැය (ලකුණු 04)

(b) ටයරයක පිරිවැය. (ලකුණු 01)

(මුළු ලකුණු 05)